**දේශපාලනයට සාධනීය වෙනසක් කිරීමේ අරමුණින්**

# පැෆ්රල් සංවිධානයේ නිර්ණායක ජනගත කිරීම 25දා කොළඹදී

**දීපා වසන්ති එදිරිසිංහ**

ශ්‍රී ලාංකේය දේශපාලනයට සාධනීය වෙනසක් එක් කිරීමේ අරමුණින් පැෆ්රල් සංවිධානය ප්‍රමුඛ සිවිල් සංවිධාන සාමූහිකය විසින් මාර්තු 12 ප්‍රකාශනය ලෙස එළිදැක්වූ නිර්ණායක 8 ජනගත කිරීම සහ ඊට මහජන අත්සන් ලබා ගැනීමේ වැඩපිළිවෙළ 2015 ජූනි 25 දින පෙරවරු 9.00ට කොළඹ 07 නිදහස් චතුරස්‍රයෙන් ආරම්භ වීමට නියමිතය.

එදින මහා සංඝරත්නය ප්‍රමුඛ සියලු ආගමික නායකයින් සහ ජනතා ආශිර්වාද මධ්‍යයේ මෙම අත්සන් ලබාගැනීම ඇරඹේ.

මාර්තු 12 ප්‍රකාශනය ලෙස හැඳින්වෙන්නේ ශ්‍රී ලාංකික දේශපාලනඥයන්ගෙන් ජනතාව අපේක්ෂා කරන අපේක්ෂකයන්ට නාමයෝජනා ලබාදීමේදී දේශපාලන පක්ෂ විසින් සලකා බැලීමට එකඟ වූ පොදු නිර්ණායක 8කි.

ජූනි 25 දින මෙම අත්සන් ලබා ගැනීම ඇරඹීමෙන් පසු දින 10ක් පුරා දිවයිනේ පළාත් නවයම ආවරණය වන පරිදි සංචාරක ප්‍රචාරක රියකින් ජනතාව දැනුම්වත් කිරීම සහ අත්සන් ලබා ගැනීම ක්‍රියාත්මක කිරීමට නියමිතය.

එම ජනතා අත්සන් සහිත අභිලාෂයන් දේශපාලන නායකයන් වෙත පිළිගැන්වීමේ උත්සවය ජූලි 5 දින කොළඹ විහාර මහා දේවි උද්‍යානයේදී පැවැත්වීමට පැෆ්රල් සංවිධානය බලාපොරොත්තු වෙයි.

එම අවස්ථාවට ජනපති, අගමැති ප්‍රමුඛ මහජන නියෝජිතයන් රැසක් සහභාගී වීමට නියමිතය.

රිවිර